මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 18/05/2021

පෙත්සම්කාරිය : එම්.ආර්.එල්. පිනදාස මිය,
63/5, මුහන්දිරම් ඊ.ඩී. දාබරේ මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

වගඋත්තරකරුවන් : 01 විදුහල්පති,
සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය,
කොළඹ 07.

02 සභාපති,
සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය,
සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය,
කොළඹ 07.

03 සභාපති,
අභියාචනා විමර්ශන කමිටුව,
සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය,
කොළඹ 07.

**පැමිණිලි අංකය : HRC/97/19**

**පැමිණිල්ල :-**

පෙත්සම්කාරිය ඇයගේ දරුවා වන මෙතුමලී විහන්සා ජයලත් යන අය වගඋත්තරකාර සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයට ගෘහ මූලික පදනම යටතේ 2019 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා යොමු අංක ගෘමු/2019/125 යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ බව කියා සිටී. ඒ අනුව 2018-09-04 දින අදාළ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි බවත්, එහිදී පෙත්සම්කාරියගේ අයදුම්පත්‍රය සහ




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson — 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrc@gmail.com

අනෙකුත් ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඇයට පහත පරිදි ලකුණු ලබාදුන් බවත් සඳහන් කර ඇත.

| | | |
|---|---|---|
| 1 | ඡන්ද නාම ලේඛනය වෙනුවෙන් | 25 |
| 2 | හිමිකම් ඔප්පුව වෙනුවෙන් | 18 |
| 3 | අතිරේක ලේඛන වෙනුවෙන් | 1.4 |
| 4 | පාසැල් වෙනුවෙන් ලකුණු අඩු කිරීමෙන් පසු | 12 |
| | | 56.4 |

ලකුණු ලබාදී ඇති බවත් වසර 30 කට අධික කාලයක් තිස්සේ පෙත්සම්කාරියගේ පියා ඉහත ලිපිනය වන කොළඹ 05, නාරාහේන්පිට, මුහන්දිරම් ඊ්බී දාබරේ මාවත, අංක 63/5 පදිංචිවී සිටින බවත්, පියාගේ ජීවිත භුක්තියට යටත්ව ඉහත ලිපිනයේ සඳහන් නිවස පෙත්සම්කාරියට තෑගි කර ඇති බවත්, ඒ අනුව වසර 7 කට ආසන්න කාලයක් තිස්සේ පෙත්සම්කාරිය සහ ඇයගේ පවුලේ සාමාජිකයින් එම ස්ථානයේ පදිංචිවී සිටි නමුත් තම දියණිය වගඋත්තරකාර පාසලට ඇතුලත් කිරීමට වගඋත්තරකරු පියවර නොගත් බවත් දක්වා ඇත. එබැවින් නිශ්චිත සුදුසුකම් සපුරා තිබියදී පාසලට ඇතුලත් නොකරන ලද ඇයගේ දියණිය වගඋත්තරකාර පාසලේ 2019 වසරේ පළවන ශ්‍රේණියට ඇතුලත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙසට මෙම පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

මෙම පැමිණිල්ලට අදාලව පැවැති 2019-02-14 දිනැති පරීක්ෂණයේදී පෙත්සම්කාරිය තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, ඇයට ඔප්පුවට හිමිවිය යුතු සම්පූර්ණ ලකුණු ප්‍රමාණය හිමි නොවූ අතර ලකුණු 18 ක් පමණක් හිමිවූ බවත් පාසලට දරුවන් ඇතුලත් කර ගන්නා කඩඉම් ලකුණු ප්‍රමාණය ලකුණු 60 ක් බවත්ය. පාසලට තෝරා ගත් දරුවන්ගේ නම් ලැයිස්තුවේ හෝ පොරොත්තු ලේඛනයේ තම දරුවාගේ නම සඳහන් නොවීම මත අභියාචනා කළ බවත් පෙත්සම්කාරිය වෙත තෑගි ඔප්පුවක් මගින් අදාළ දේපළ ඇයගේ පියා විසින් 2014 වසරේ පවරා තිබීම යන හේතුව මත ඇයට මුළු ලකුණු හිමි නොවූ බවත් ප්‍රකාශ කර ඇත. තවද ඇයගේ පියාහට අදාළ ඉඩමේ වසර 36ක හිමිකම් පවතින බවත්, තමා වෙත අදාළ ඔප්පුව ත්‍යාග කොට පවරාදෙන තෙක් අඛණ්ඩව එම හිමිකම පැවැති බැවින් හා තමා නමට පවතින ත්‍යාග ඔප්පුවේ තම පියාගේ ජීවිත භුක්තිය පවතින බැවින් ඊට අදාලව ලබාදෙනු ලබන ලකුණු 23 ක ප්‍රමාණය හෝ ලබා දෙන ලෙසට ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-**

අදාළ පරීක්ෂණයේදී වගඋත්තරකාර පාසල වෙනුවෙන් එම පාසලේ නියෝජ්‍ය විදුහල්පතිතුමිය කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පෙත්සම්කාරිය සම්මුඛ පරීක්ෂණයට කැඳවා ලකුණු

56.04 ක් ලබාදී ඇති බවත් පෙත්සම්කාරියගේ තෑගි ඔප්පුව පත්ඉරු පරීක්ෂා කිරීමෙන් පසුව 2014-08-15 දින ලියාපදිංචි කර ඇති බව 'අනාවරණය වීමෙන් පසුව වසර 04-03 අතර කාලය සලකා ලකුණු 18 ක් ඔප්පුව සඳහා ලබාදුන් බවත්ය. තවද වගඋත්තරකාර පාර්ශවය පවසා ඇත්තේ පෙත්සම්කාරියගේ පියාගේ හිමිකම තෑගි ඔප්පුවක් ලෙස සම්පූර්ණයෙන් පෙත්සම්කාරියට පවරා ඇති අතර පත්ඉරු ඔප්පු වලින් එය සනාථ වන බවයි. 24/2018 චක්‍රලේඛනය අනුව හිමිකම් ඔප්පුව පෙත්සම්කාරියට ඇති අවස්ථාවකදී නැවත පෙර ඔප්පුව සලකා ලකුණු ලබාදීමට කිසිදු හැකියාවක් නොමැති බවත් හිමිකම් ඔප්පුව පත්ඉරු මගින් සනාථ කරගෙන ලකුණු ලබා දෙන ලෙසට චක්‍රලේඛනයේ පැහැදිලිව සඳහන් කර ඇති බවත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී සලකා බැලූ සියලුම ඔප්පු සඳහා එකම ආකාරයට ලකුණු ලබාදී ඇති බවත් දක්වා ඇත. හිමිකම් සම්පූර්ණයෙන් පවරා දී ඇති හෙයින් චක්‍රලේඛනය අනුව පෙර ඔප්පුවට ලකුණු ලබාදීමට හැකියාවක් පාසලට නොමැති බව වැඩිදුරටත් වගඋත්තරකාර පාර්ශවය දන්වා සිටින ලදී. තවද අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් ද මෙය තවදුරටත් සනාථ කර ඇති බවත් පවසා සිටින ලදී.

**කොමිෂන් සභාවේ නිරීක්ෂණ :-**

ඉහත පෙත්සම්කාරියගේ සහ වගඋත්තරකාර පාර්ශවයේ පැමිණිල්ල සහ පරීක්ෂණයේදී ඔවුන් විසින් ප්‍රකාශ කරන ලද කරුණු සලකා බැලීමේදී පෙත්සම්කාරිය ඇයගේ දරුවා වගඋත්තරකාර පාසලට ඇතුලත් කිරීම සඳහා ගෘහ මූලික පදනම මත අයදුම්පත්‍ර ඉදිරිපත් කළ බවත් ගෘහ මූලික පදනම මත යම්කිසි ඉල්ලුම්කරුවෙක් ඉල්ලීම් කරන අවස්ථාවේ එකී ඉල්ලුම්කරු අයදුම්පත්‍රයේ සඳහන් කරන ස්ථානයේ ස්ථිරව පදිංචි වී සිටින බව තහවුරු කර ගැනීමයි. මෙම පෙත්සමේ පෙත්සම්කාරිය පවසා සිටින්නේ පෙත්සම්කාරියගේ පැමිණිල්ලේ සඳහන් කරන ආකාරයට පෙත්සම්කාරියට ඇයගේ පියාගෙන් තෑගි වශයෙන් ලබාදී තිබෙන මෙම තෑගි ඔප්පුවට වගඋත්තරකරු විසින් ලකුණු 18 ක් ලබාදී තිබෙන බවයි.

පෙත්සම්කාරිය මෙම අවස්ථාවේදී 2014 වසරේ ඇයගේ පියා මෙම ඔප්පුව ඇයගේ නමට හරවා දී තිබෙන්නේ ඇයගේ දරුවාව වගඋත්තරකාර පාසලට ඇතුලත් කර ගැනීම සඳහා වැඩි ලකුණක් ලබා ගැනීමට බවත් වසරින් වසර චක්‍රලේඛනයේ වගන්ති වෙනස් කිරීමේදී 24/2018 චක්‍රලේඛනයට අනුව ඇයගේ නමට ඔප්පුව තිබුණද පෙත්සම්කාරියට කාලය පිළිබඳව සැලකීමේදී ලකුණු අඩුවෙන් ලබා දෙන ලද බවයි. එම ලකුණු ලබාදී තිබෙන්නේ චක්‍රලේඛනයේ විධිවිධාන ප්‍රකාරවය.

කෙසේ වෙතත් පෙත්සම්කාරියගේ පියාගේ නමින් මෙම ඉඩමේ ඔප්පුව තිබියදී පෙත්සම්කාරියට මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු 18 ට වඩා වැඩි ලකුණු සංඛ්‍යාවක් වන ලකුණු 23

ක් ලබා ගැනීමට චක්‍රලේඛනයෙන් ඉඩකඩ ඇති බව නිරීක්ෂණය වේ. නමුත් පෙත්සම්කාරියට එම අවස්ථාව ගිලිහී ඇති බව පෙනේ. ගෘහ මූලික පදනම යටතේ ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රයක් වගඋත්තරකාර පාසල විසින් පරීක්ෂා කිරීමේදී වඩාත්ම නිවැරදි ආකාරයට පරීක්ෂණයට ලක්විය යුත්තේ අයදුම්කරුවන් එකී ලිපිනයේ ස්ථිරව පදිංචි වී සිටින බව තහවුරු කර ගැනීමයි. පෙත්සම්කාරිය ඇයගේ අයදුම් පත්‍රය සමග අමුණා ඇති දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ආකාරයට සලකා බැලීමේදී දරුවාගේ උප්පැන්න සහතිකය, මවගේ/ පියාගේ ජාතික හැඳුනුම්පත, ග්‍රාම සේවා නිලධාරී නිකුත් කරන පදිංචි සහතිකය, ඉඩමේ ඔප්පුව, ඡන්ද හිමි නාම ලේඛන, විදුලි බිල්පත්, ජල බිල්පත්, ජීවිත රක්ෂණ හිමිකම් ඔප්පුව, විවාහ සහතිකය, පාසැල් හැරයාමේ සහතිකය, දරුවාගේ සෞඛ්‍ය වර්ධන සටහන් පොත, වරිපනම් බදු බිල්පත් යනාදි පෙත්සම්කාරියගේ නමට හෝ ඇයගේ දෙමාපියන්ගේ නමට ඉහත ලිපිනයේ ලියාපදිංචි වී තිබෙන බව පැහැදිලි වේ.

මෙම ලේඛන වලින් තහවුරු වන්නේ පෙත්සම්කාරිය අඛණ්ඩව ඉහත කී ලිපිනයේ පදිංචි වී සිටින බවයි. පෙත්සම්කාරියට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්පූර්ණ ලකුණු **56.4** ක් ලබාදී ඇති අතර මෙම ගණය යටතේ පාසලට ළමුන් ඇතුලත් කර ගන්නා වූ කඩඉම් ලකුණු ප්‍රමාණය ලකුණු **60** ක් වේ. පෙත්සම්කාරියගේ නමට ඇති තෑගි ඔප්පුව සඳහා ලකුණු **18** ක් ලබාදී තිබුණද ඇයට කඩඉම් ලකුණු ප්‍රමාණයට ළගාවීමට තව ලකුණු **3.6** ක් අවශ්‍ය වී තිබේ. මේ අවස්ථාවේදී පෙත්සම්කාරිය ඇයගේ පියාගේ නමට තිබෙන සින්නක්කර ඔප්පුවද අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ බව සනාථ වේ. වගඋත්තරකාර පාසල පෙත්සම්කාරියගේ පියාගේ නමින් තිබෙන මෙම ඔප්පුවද සලකා බලා තිබේ නම් එම පියාගේ නමට තිබෙන ඔප්පුව සඳහා චක්‍රලේඛනය ප්‍රකාරව ලකුණු **23** ක් ලබා දියයුතුව පවතින බව නිරීක්ෂණය වේ. එකී ලකුණු **23** ලබාදී තිබුනේ නම් පෙත්සම්කාරියට මෙම ගණය යටතේ පාසලට ළමුන් ඇතුලත් කර ගන්නා වූ අවම ලකුණු ඉක්මවා යාමට ඉඩකඩ පවතින බව නිරීක්ෂණය වේ.

ඉහත කී කරුණු කාරණා සලකා බැලීමේදී පෙත්සම්කාරිය එකී ලිපිනයේ අඛණ්ඩව පදිංචි වී සිටින බවත්, නිවස පිළිබඳ ඇයගේ පියාට තිබූ ඔප්පුව සලකා බැලීමට වගඋත්තරකාර පාර්ශවය ක්‍රියාකර නොමැති බවත් තවදුරටත් පෙනී යයි. මෙහිදී වගඋත්තරකාර පාර්ශවය පෙත්සම්කාරිය විසින් ඉදිරිපත් කළ සියලු ලේඛන සලකා බැලුවේ නම් පියාගේ නමට තිබෙන ඔප්පුව සලකා බැලීම සුදුසු බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ. මෙහිදී ලගම පාසල ලබාදීමේදී අඛණ්ඩ පදිංචිය සලකා බැලීමේදී ප්‍රායෝගිකව ඉහත ආකාරයට සලකා බැලීම සුදුසු බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

**නිගමනය :-**

මෙම සමස්ථ කරුණු අනුව, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) වගන්තියේ සඳහන් නීතිය ඉදිරියේ සමානත්වයෙන් සැලකීමේ අයිතිය වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

පෙත්සම්කාරියගේ දරුවා වන මෙතුම්දි ගිහන්සා ජයලත් දරුවාව ඇතුලත් විය යුතු නියමිත ශ්‍රේණියට ඇතුලත් කිරීමට කටයුතු කල යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021.06.21 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

| | |
|---|---|
| අනුසූයා ෂන්මුගනාදන්, | මා.හේ. නිමල් කරුණාසිරි, |
| කොමසාරිස්, | කොමසාරිස්, |
| ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. |
| Ms. Anusuya Shanmuganathan | Dr. M.H. Nimal Karunasiri |
| Commissioner | Commissioner |
| Human Rights Commissioner of Sri Lanka | Human Rights C... Lanka |

පිටපත :- 1. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

B/